**සවුදි අරමුදලින් මාර්ග ජාලය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය - 2015**

--------------------------------------------------------------------------------

සවුදි අරමුදලින් මාර්ග ජාලය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා සංවර්ධනය සඳහා වූ සවුදි අරමුදල අතර 2012 ඔක්තෝබර් 30 දින එළඹි අංක 9/574 දරන ණය ගිවිසුම සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම,අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව, එවකට මහාමාර්ග, වරාය හා නාවික අමාත්‍යාංශය වර්තමානයේ උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. මධ්‍යම, නැගෙනහිර, සබරගමුව, බස්නාහිර හා වයඹ පළාත්වල මාර්ග 09 ක කිලෝමීටර 138.39 ක කොටස් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම ව්‍යාපෘතියේ අරමුණ වේ. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 10,628 කට සමාන එ.ජ.ඩො.මිලියන 81.75 ක් වූ අතර ඉන් රු. මිලියන 7,800 කට සමාන එ.ජ.ඩො.මිලියන 60 ක් සැපයීමට සංවර්ධනය සඳහා වූ සවුදි අරමුදල විසින් එකඟවී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2013 ජුනි 03 දින ආරම්භ කරන ලද අතර 2016 දෙසැම්බර් 31 වන විට නිමකිරීමට සැලසුම් කර තිබුණි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුලත්වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ ඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුලත්වේ. මාගේ මතය සඳහා පදනමක්

සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

**(අ)** අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

**(ආ)** ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව,

**(ඇ)** ශ්‍රී ලංකා රජය හා ණය සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගතවූ වත්කම් සහ වගකීම්, ණයවලින් කරන ලද මිලදී ගැනීම් ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේ ද යන බව.

**(ඈ)** ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේ ද යන බව.

**(ඉ)** ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය සහ උපකරණ, ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේ ද යන බව.

**(ඊ)** ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයන්ට අනුව වියදම් නිවැරදිව හඳුනාගෙන තිබුණේ ද යන බව.

**(උ)** ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේ ද යන බව.

**(ඌ)** මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වාදෙන ලද කරුණු නිවැරදි කරගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේ ද යන බව සහ,

**(එ)** ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූලවූයේද යන බව.

## 2. <u>මූල්‍ය ප්‍රකාශන</u>

### 2.1 <u>මතය</u>

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මා දරන්නා වූ මතය වනුයේ,

(අ) 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2015 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වාදෙන ලද කරුණු නිවැරදි කරගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඈ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

## 3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

### 3.1 අරමුදල් උපයෝජනය

මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය හා සමාලෝචිත වර්ෂය තුල සහ 2015 දෙසැම්බර් 31 දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුමේ මූල්‍යයනය සඳහා එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරන ලද වෙන් කිරීම | උපයෝජනය කළ අරමුදල් | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | සමාලෝචිත වර්ෂය තුල | | 2015 දෙසැම්බර් 31 දිනට | |
| | එ.ජ.ඩො මිලියන | රුපියල් මිලියන | රුපියල් මිලියන | එ.ජ.ඩො මිලියන | රුපියල් මිලියන | එ.ජ.ඩො මිලියන | රුපියල් මිලියන |
| සංවර්ධනය සඳහා වූ සවුදි අරමුදල | 60.00 | 7,800 | 3,805.00 | 21.77 | 2,944.61 | 37.10 | 4,937.70 |
| ශ්‍රී ලංකා රජය | 21.75 | 2,828 | 72.39 | - | 56.22 | - | 176.50 |
| | 81.75 | 10,628 | 3,877.39 | 21.77 | 3,000.83 | 37.10 | 5,114 20 |

ඉහත තොරතුරු අනුව ව්‍යාපෘතියට සිදුකල සමස්ථ ප්‍රතිපාදනය වූ ඇ.එ.ජ.ඩො. මිලියන 60 කට සමාන රු.මිලියන 7,800 න් ඇ.ඩො. මිලියන 37.10 ට සමාන රු.මිලියන 4,937.70 ක් නියෝජනය වන සියයට 61.83 පමණක් 2015 දෙසැම්බර් 31 දිනට උපයෝජනය කර තිබුණි. ඉතිරි ප්‍රතිපාදනය වූ ඇ.ඩො. මිලියන 22.90 ඉතිරි අවුරුදු 1 ක ව්‍යාපෘති කාලය තුල වැය කිරීම ඉතා අපහසු බව පෙන්නුම් කෙරේ.

**3.2 භෞතික ප්‍රගතිය**

ව්‍යාපෘති ප්‍රගති වාර්තාවලට අනුව මහනුවර - යාපනය මාර්ගයේ පුනරුත්ථාපන හා වැඩිදියුණුකිරීම් වැඩ කටුගස්තොට සිට නාඋල දක්වා කි.මී.50 තුල මාර්ග කොටස් 3 ක්ද, කොළඹ - මහනුවර මාර්ගයේ පැලියගොඩ සිට කිරිබත්ගොඩ දක්වා කි.මී.7.24 ක්ද තම්පලගාමම් - කින්නියා මාර්ගයේ කි.මී.8.5 ක් ද වැඩ නිමකොට 2015 දෙසැම්බර් 31 දිනට මාර්ග සංවර්ධන අධිකාරියට භාරදී තිබුණි. තවද, දෙහිඕවිට - දැරණියගල නූරිය මාර්ගයේ කි.මී.14 පුනරුත්ථාපන හා වැඩිදියුණුකිරීම 2015 දෙසැම්බර් 31 දිනට ප්‍රමාණවත් ලෙස නිමකර තිබුණි.

**3.3 කොන්ත්‍රාත්තු පරිපාලනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ)** දෙහිඕවිට - දැරණියගල මාර්ගයේ පුනරුත්ථාපන හා වැඩිදියුණුකිරීම් විෂයපථයට ඇතුලත් නොවූ දිස්ත්‍රික් රෝහල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා දැරණියගල පොලිස් ස්ථාන යන ප්‍රවේශ මාර්ගයන් වැඩිදියුණුකිරීම් සිදුකර ඇති බව අනාවරණය විය. එහි ප්‍රතිඵලයක් ලෙස රු.මිලියන 161.52 ක පිරිවැය ඉක්මවීම් සිදුවී තිබූ අතර විචලතා නියෝග 27 හරහා ව්‍යාපෘතිය ඒවා අනුමත කර තිබුණි. ව්‍යාපෘතිය ආරම්භක පියවරේදී ව්‍යාපෘති අධීක්ෂණ අංශය පුනරුත්ථාපන වැඩවල විස්තරාත්මක නිර්මාණ සැලසුම් විධිමත් ලෙස සිදුකලේ නම්, දැරූ අතිරේක පිරිවැය අවම කිරීමට හැකි බව විගණනයේදී නිරීක්ෂණය විය.

**(ආ)** මහනුවර - යාපනය මාර්ගයේ කටුගස්තොට සිට අලවතුගොඩ දක්වා වූ කි.මී.11 මාර්ග කොටසේ මාර්ග මතුපිට දෝෂ කිහිපයක් 2016 ජූලි 11 දින විගණකවරුන් සිදුකරන ලද ස්ථානීය පරීක්ෂණවලදී අනාවරණය විය. පහත පරිදි විස්තර කෙරේ.

| දෝෂවල ස්වභාවය | නිරීක්ෂණය වූ අවස්ථා ගණන |
|---|---|
| මාර්ග මතුපිට ඉරිතැලීම් | 221 |
| මාර්ග මතුපිට හානිවීම් | 56 |
| මාර්ග උරහිස් ඉවතට යෑම් | 146 |
| මුළු දෝෂ | 423 |

තවද, මහනුවර - යාපනය මාර්ගයේ අලවතුගොඩ - පලාපත්වල මාර්ග කොටසේ කි.මී. 17 ක මාර්ග මතුපිට හානිවීම් 04 ක්, මාර්ග උරහිස් බදනය දික් මීටර් 28 විගණකවරුන්ගේ පරීක්ෂණ කාලය තුලදී විමර්ශනය කරන ලදී.

**3.4 මතභේදයට තුඩුදෙන කරුණු**

මහනුවර - යාපනය මාර්ගයේ කටුගස්තොට සිට අලවතුගොඩ දක්වා වූ මාර්ග කොටසේ පුනරුත්ථාපන හා වැඩිදියුණුකිරීම් වලට සම්බන්ධ කොන්ත්‍රාත්කරුට හිමිකම් (claims) ප්‍රමාදව ගෙවීම් සිදුකිරීම නිසා අතිරේක රු.මිලියන 3.58 ක් පොලී වශයෙන් ගෙවා තිබුණි.